# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,827—1961 දෙසැම්බර් 16 වැනි සෙනසුරාදා—16.12.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—ඞී.97/41.

පී. ඇන්. 1742.

### පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත

පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතෙහි (432 වෙනි අධිකාරය) 9 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් පනවනු ලබන නියෝග.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1961 දෙසැම්බර් මස 15 දින,
කොළඹ.

#### නියෝගය

1. 1928 පෙබරවාරි 24 වෙනි දින හා අංක 7,631 දරන ගැසට් පත්‍රයෙහි (එහි ලා "ව්‍යවස්ථා" යනුවෙන් සඳහන් ව) පළ කරනු ලැබ, කලින් කල සංශෝධනය කරනු ලැබූ පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් නියෝග පහත දක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) 2 වෙනි නියෝගයෙහි—

(ඒ) (1) වෙනි ඡේදය වෙනුවට පහත සඳහන් අළුත් ඡේදය, එනම් :—

[(i) "පාසැල" යන්නෙන් (1) සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් දිවයිනේ මහජන මුදල්වලින් නඩත්තු කරනු ලබන පාසැලක්, හෝ

(ii) අධ්‍යාපන ආඥාපනතෙහි (185 වෙනි අධිකාරය) විස්තර කොට ඇති පරිදි හා ඒ පිළිබඳ ව ඒ ආඥාපනතෙහි 49 වෙනි වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියාකොට ඇති ආධාර නො ලබන පාසැලක්, හෝ

(iii) 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනතෙහි 3 වෙනි වගන්තිය හෝ 5 වෙනි වගන්තිය යටතේ ආධාර නො ලබන පාසැලක් බවට පත් වී ඇති පාසැලක්.] ;

ආදේශ කිරීමෙන් ද,

(බී) (ix) වෙනි ඡේදයේ පළමුවෙනි අතුරු විධානයේ (ජී) අනුච්ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් අනුච්ඡේද, එනම් :—

(එච්) "අධ්‍යාපන ආඥාපනතෙහි (185 වෙනි අධිකාරය) විස්තර කොට ඇති පරිදි හා ඒ පිළිබඳ ව ඒ ආඥාපනතෙහි 49 වෙනි වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියාකොට ඇති ආධාර නො ලබන පාසැලකට 1962 ජනවාරි 1 වෙනි දින හෝ ඉන් පසු ව පත් කරනු ලැබූ ගුරුවරයකුගේ සේවය";

(අයි) "1960 අංක 5 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනතෙහි 3 වෙනි වගන්තිය හෝ 5 වෙනි වගන්තිය යටතේ ආධාර නො ලබන පාසැලක් බවට පත් වී ඇති යම් පාසැලකට 1960 දෙසැම්බර් 1 වෙනි දින හෝ ඉන් පසු පත් කරනු ලැබූ ගුරුවරයකුගේ සේවය";

ඇතුළත් කිරීමෙන් ද,

(2) 7 වෙනි නියෝගය වෙනුවට පහත සඳහන් අළුත් නියෝගය, එනම් :—

"7. වයස අවුරුදු 60 සම්පූර්ණ කළ විට සෑම ගුරුවරයකු විසින් හෝ ගුරුවරියක විසින් විශ්‍රාම ගැනීම අනිවාර්ය විය යුතු ය ;"

ආදේශ කිරීමෙන් ද,

(3) 9බී නියෝගයට ඉක්බිතිව ම පහත සඳහන් අළුත් නියෝගය, එනම් :—

"9සී. (i) යම් පාසැලක් පවත්වාගෙන යනු ලැබූ හා නඩත්තු කරනු ලැබූ ස්ථානය 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතෙහි 4 වෙනි වගන්තිය යටතේ වූ ආඥාවකින් රජය වෙත පවරනු ලබන කල, එබඳු යම් පාසැලක සේවයෙහි නියුක්ත ගුරුවරයකුට, රජය යටතේ සේවය කිරීමට තමා කැමති නොවේ නම්, සටහන් කරනු ලැබූ මාස එකසිය විස්සකට නො අඩු සේවයක් පාසැලක හෝ පාසැල්වල ඔහු සම්පූර්ණ කර ඇති නම් හා 1962 ජනවාරි 31 වෙනි දින ඉකුත්වීමට පෙර ද ඒ සේවය රජය වෙත පවරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත යම් දිනයක් ද යන දින දෙකින් පසු ව එළඹෙන දිනයෙහි විශ්‍රාම ගැනීමේ කැමැත්ත ඔහු ක්‍රියාවේ යෙදුවහොත් පමණක් ස්වකීය කැමැත්ත පරිදි විශ්‍රාම වැටුප් සහිත ව විශ්‍රාම ගැනීමට අවසර දිය හැක්කි ය.

(ii) (i) වෙනි ඡේදය යටතේ ගුරුවරයකුට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ කාර්ය්‍යය සඳහා, ඒ ගුරුවරයාගේ සටහන් කරනු ලැබූ සේවය—ඒ සේවය දායක සේවයක් හෝ දායක නො වන සේවයක් වුව ද—සටහන් කරනු ලැබූ ඒ සේවයෙහි ඇතුළත් දෙ මසකින් යුත් එක් එක් සම්පූර්ණ කාලසීමාව සඳහා වන්දි වශයෙන් එක මාසයක් එකතු කිරීමෙන් වැඩිකළ යුතු ය :

එසේ වුව ද එ ලෙස කරනු ලැබූ එකතු කිරීම කවර අවස්ථාවක දී වුව ද පහත සඳහන් සීමා දෙකින් කුඩා සීමාව නො ඉක්මවිය යුතු ය :—

(ඒ) මාස 60 ක සීමාවක් ; හෝ

(බී) අවුරුදුවලට පරිවර්තනය කරනු ලැබූ කල හා ගුරුවරයා විශ්‍රාම ගන්නා විට ඔහුගේ නියම වයසට එකතු කරනු ලැබූ කල අවුරුදු හැටක (60) මුළු ගණනක් සෑදීමට ප්‍රමාණවත් විය හැකි මාස ගණනක සීමාවක්.

(iii). (ii) වෙනි ඡේදයෙහි දක්වා ඇති ආකාරයෙන් වැඩි කරනු ලැබූ සටහන් කළ සේවය සම්බන්ධයෙන්, ගෙවිය යුතු විශ්‍රාම වැටුප්, මාස හාරසිය අසූවකට අධික ව ඇති සටහන් කරනු ලැබූ සේවයට ඇතුළත් කිසි ම කාලසීමාවක් සැලකිල්ලට භාජනය නො කළ යුතු ය යන කොන්දේසියට යටත් ව, පහත සඳහන් ප්‍රමාණ අනු ව ගණන් බැලිය යුතු ය:—

(ඒ) දයක සේවයට අයත් එක් එක් මාසය සඳහා වැටුපෙන් 1/720ක් ; හා

(බී) දයක නො වන සේවයට අයත් එක් එක් මාසය සඳහා වැටුපෙන් 1/960 ක්.

මේ ඡේදයෙහි කාර්‍යය සඳහා "වැටුප්" යන්නෙන් විශ්‍රාම ගන්නා විට ගුරුවරයාට ලැබුණු මාසික වැටුප අදහස් වේ.

(iv) (i) වෙනි ඡේදයෙහි සඳහන් ගුරුවරයෙක් ඒ ඡේදය යටතේ විශ්‍රාම වැටුපකට සුදුසුකම් නො ලබන අවස්ථාවක, සටහන් කරනු ලැබූ සේවයට අයත් මාසවලදී ගෙවනු ලැබූ සම්පූර්ණ දයක මුදලට සමාන මුදලක් 5 වෙනි නියෝගය අනු ව ඔහුට ලැබිය හැකි ය ;"

ඇතුළත් කිරීමෙන් ද වේ.

2. 1 වෙනි නියෝගය මගින් පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් නියෝගයෙහි කරනු ලැබූ සංශෝධනය, 1960 දෙසැම්බර් 1 වෙනි දින පටන් ක්‍රියාත්මකව වලංගු වී ඇතැයි සළකනු ලැබිය යුතු ය.

12-1109/1

---

ඇල්. ඩී.—බී. 97/41.

පී. ඇන්. 1735.

## විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා

1948 අංක 13 දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1934 පෙබරවාරි 5 වෙනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන් හි 51 වෙනි වගන්තිය යටතේ නිවේදනය.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1961 දෙසැම්බර් මස 15 දින,
කොළඹ දී ය.

**නිවේදනය**

1. කලින් කල සංශෝධනය කරන ලද 1934 පෙබරවාරි 5 වෙනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන් හි 48එෆ් වගන්තියේ (1) වෙනි උපවගන්තිය, එහි අතුරු විධානය සඳහා පහත සඳහන් අළුත් අතුරු විධානය ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"එසේ වුවද —

(අ) භාණ්ඩාගාරයේ ලේකම්ගේ මතය අනුව විනයෙහි යහපත සඳහා හෝ මහජන යහපත සඳහා අවශ්‍ය වූ විට, මේ උප වගන්තියෙහි විධිවිධාන යටතේ යම් රජයේ සේවකයකුට විශ්‍රාම ගැනීමට භාණ්ඩාගාරයේ ලේකම් විසින් අවසර නො දිය හැකි ය ; තවද

(ආ) මෙහි උ (ජී) උපලේඛනයෙහි නියමිත යම් රජයේ සේවකයකුට මේ උපවගන්තියෙහි ඉහතින් දක්වා ඇති විධිවිධාන අදාල නො විය යුතු ය.".

2. මේ නිවේදනයෙහි I වෙනි ඡේදයෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන් හි කරන ලද සංශෝධනය 1961 මැයි 24 වෙනි දින වලංගු වූ ලෙස සැලකිය යුතු ය.

12-1109/2

ඇල්. ඩී.—බී. 97/41.

පී. ඇන්. 1735.

## විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා

1948 අංක 13 දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1934 පෙබරවාරි 5 වෙනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන් හි 51 වෙනි වගන්තිය යටතේ නිවේදනය.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1961 දෙසැම්බර් මස 15 දින,
කොළඹ දී ය.

**නිවේදනය**

1. කලින් කල සංශෝධනය කරන ලද 1934 පෙබරවාරි 5 වෙනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා එහි ජී උපලේඛනයේ (II) වෙනි ඡේදයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(12) යම් ලාංකික නො වන රජයේ සේවකයෙක්.".

2. මේ නිවේදනයෙහි 1 වෙනි ඡේදයෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන් හි කරන ලද සංශෝධනය 1961 දෙසැම්බර් 1 වැනි දින වලංගු වූ ලෙස සැලකිය යුතු ය.

12-1109/3

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රේගු නිවේදනය අංක 61/9/4

ආදායම් සංරක්ෂණ ආඥාපනත (250 වැනි අධිකාරය) යටතේ, අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාව අනුව, 1961 දෙසැම්බර් 18 වැනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක් තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තුව පහත දැක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන් කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

**රබර්**

| | රු. | ශ. |
|---|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම රාත්තලට ... | 1 | 21 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව රාත්තලට ... | | .14 |

මැ. ලු. ඩි. කැෂ්පර්ස්,
ප්‍රධාන රේගු අයකැමි.

අංක : ඒ781
රේගු දෙපාර්තමේන්තුව,
කොළඹ, 1961 දෙසැම්බර් 16.

12-1110

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.